# <u>සති පාසල කාර්ය පත්‍රිකාව</u>

**1. පන්තිය :** 11 ශ්‍රේණිය **විෂය : චිත්‍ර** **අදාළ සතිය :** 5 වන සතිය

**2. පාඩම හෝ පාඩම් ඒකකය : 1.3.1.** "මංගල නැකතින් අතිනත් ගත් දා" යන මාතෘකාවට චිත්‍රයක් නිර්මාණය කර වර්ණ ගන්වන්න.

**3. ශිෂ්‍යයා කළ යුතු කාර්යයන් :**


- ඔබ සහභාගි වී ඇති හෝ ඡායාරූප, චිත්‍රවල දක්නට ලැබුණු විවිධ සංස්කෘතීන්ට අයත් විවාහ මංගල උත්සව අවස්ථාවන් හා වත්පිළිවෙත් ඇඳුම් පැළඳුම් සහ පරිසරය පිළිබඳව මතකයට නගා ගන්න.
- මහනුවර සාම්ප්‍රදායේ සිතුවම්වල දක්නට ලැබෙන චිත්‍රමය සිද්ධාන්ත ගැන මතකයට නගා ගන්න.
- තම සංස්කෘතියට ගැලපෙන (උචිත) පරිදි විවාහ මංගල උත්සවයක සිත්ගත් අවස්ථාවක් තේමාව වශයෙන් තෝරා ගන්න.
- චිත්‍ර අඳින කඩදාසි,පැන්සල්, ඇඳීමේ උපකරණ හා වර්ණ සූදානම් කර ගන්න.
- සාම්ප්‍රදායික චිත්‍ර ශෛලියට ගැලපෙන පරිදි මානව රූප ඇඳීම, හැඩතල සංරචනය, සැරසිලි මෝස්තර භාවිතය, පසුබිම යෙදීම හා වර්ණ භාවිතය සිදුකළ යුතුයි.

**4 ඉහත ක්‍රියාකරම් සඳහා උපකාර කර ගත හැකි පොත්පත්, වෙබ් අඩවි LMS පාඩම් හා ඉගෙනුම් ආධාරක -**

- ආදර්ශ සිතුවම්



මහාධන සිටුවරයාගේ කථාව - සංගීතය හා විනෝද වීම
(කතළුව විහාරය)



සුතසෝම ජාතකය - රජමැදුරේ කාන්තාවෝ
(කතළුව විහාරය)

- කියවීම් පත්‍රිකාව

**_පහතරට විහාර චිත්‍ර ශෛලියේ දැකිය හැකි පොදු ලක්ෂණ_**

- ⋆ *තීරු චිත්‍ර සංරචනය, අඛණ්ඩ කථන ක්‍රමය හා පාර්ශ්වදර්ශී රූප නිර්මාණය*
- ⋆ *රූප වටා නිමාව දක්වන ප්‍රශස්ත මට්ටමින් යුතු සියුම් රේඛාකරණය*
- ⋆ *සමස්ත සංරචනය තුළ පරිමාණ රීතීන් නොසැලකීම*
- ⋆ *පර්යාලෝක රීතීන් පෙන්වීමට උත්සාහ කර තිබීම*
- ⋆ *පසුබිම අවකාශය පිරවීම සඳහා විවිධ අලංකරණ සැරසිලි මෝස්තර භාවිතය*
- ⋆ *වස්ත්‍රාභරණ අලංකාරව හා විස්තරාත්මක ව දැක්වීම*
- ⋆ *යුරෝපීය ලක්ෂණ සහිත වාස්තුවිද්‍යා, ගෘහ භාණ්ඩ හා සංගීත භාණ්ඩ, ඇඳුම් පැළඳුම් වැනි අංග දැක්වීම*
- ⋆ *වර්ණ සඳහා කහ, නිල්, කොළ, රතු, අළු, කළු, සුදු ආදී වර්ණ භාවිතය හා වර්ණවල තද හා ළා පැහැය සමග ඉතා සියුම් ව මතු කරන ත්‍රිමාන ලක්ෂණ දැක්වීම*
- ⋆ *බහුල වශයෙන් පසුබිම සඳහා රක්ත වර්ණයට වඩා අළු, කළු හා තද නිල් වැනි වර්ණ භාවිතය*

**5. මෙම සතිය තුළ නියමිත පාඩම්වලින් ලබාගත යුතු ඉගෙනුම් ඵල :**

- ■ විවිධ සංස්කෘතීන්ට අයත් විවාහ මංගල උත්සව හා චාරිත්‍ර වාරිත්‍ර පිළිවෙත්, ඇඳුම් පැළඳුම් සහ පරිසරය විස්තර කරයි.
- ■ මහනුවර යුගයේ පහතරට සම්ප්‍රදායේ බිතුසිතුවම්වල චිත්‍රමය සිද්ධාන්ත අවබෝධයෙන් ප්‍රකාශ කරයි.
- ■ විවාහ මංගල උත්සවයක සිත්ගත් අවස්ථාවක් සාම්ප්‍රදායික චිත්‍ර ශෛලිය භාවිතයෙන් චිත්‍රණය කරයි.
- ■ සංයමයෙන් යුතුව නිර්මාණකරණයේ යෙදෙයි.
- ■ නිර්මාණ රස විඳිමින් අගය කරයි.

**6. ඇගයීම්/තක්සේරුකරණ ක්‍රමවේද හා ආකෘති**

- ⋆ මහනුවර යුගයට අයත් පහත රට විහාර බිතු සිතුවම් නිරීක්ෂණය කර මානව රූප ඇඳීම, සැරසිලි මෝස්තර නිර්මාණය කිරීම හා වර්ණ භාවිතය පිළිබඳ අභ්‍යාසවල නිරත වන්න.

සැකසුම : එල්.ඩබ්.එන්. නිරූපා

පාසල : කෑ/දැදි/මැණික්කඩවර ක.වි.